www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා ජනාධිපතිනිය ප්‍රජාතන්ත්‍ර විරෝධී හදිසි නීති පනවයි

## Sri Lankan president imposes anti-democratic emergency laws

**කේ. රත්නායක**
**2005 ජනවාරි 31**

ශ්‍රී ලංකාවේ ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග දෙසැම්බර් 26 දින ව්‍යසනකාරී සුනාමියට ප්‍රතිචාර දැක්වූයේ මරු පහරක් දෙමින් දිවයිනේ දිස්ත්‍රික්ක 25න් 15ක ම හොර රහසේ හදිසි නීතිය පැනවීමෙන් ය.

දේශපාලන විවේචන හෝ විරෝධය පෑම් මර්දනය කිරීම සඳහා පොලීසියට හමුදාවට සහ නිලධරයට බලය පැවරීම ඇතුලත් කරගත්තා වූ මෙම විධිවිධාන ජනවාරි 4 වන දා සිට ම බලපැවැත්වුන නමුත් ප්‍රසිද්ධියට පත් කැරුනේ ජනවාරි 25 වනදා ය!

හදිසි නීති රෙගුලාසි ප්‍රථමයෙන් මහජන අවධානයට යොමු කරනු ලැබුවේ එක්සත් ජනතා නිදහස් සන්ධාන (එජනිස) ආන්ඩුව විසින් නොව ශ්‍රී ලංකාවේ සිවිල් අයිතිවාසිකම් සංවිධානය විසිනි. (සීආර්එම්) තමන් පාලනය වනුයේ කවර නීතියක් යටතේ ද යන්න මහජනයා විසින් දැන සිටීම ‘අනභියෝගී’ වන බව ප්‍රකාශ කරමින් සීආර්එම් ය ජනවාරි 13 වන දා නිකුත් කල නිවේදනයකින් රෙගුලාසි ප්‍රසිද්ධ නො කිරීම පිලිබඳව සිය කනස්සල්ල පල කලේ ය.

හදිසි තත්වය ප්‍රකාශ කිරීමට පෙර ජනවාරි 3 වන දා කුමාරතුංග සහන කටයුතුවල අධිකාරය මිලිටරියට පැවරුවා ය. ආරක්ෂක මන්ඩල ප්‍රධානී අද්මිරාල් දයා සඳගිරි සහන කටයුතුවල පූර්න බලධාරියා ලෙස පත් කෙරුනු අතර දිස්ත්‍රික්ක 12ක සහන කටයුතු සම්බන්ධීකරනයට ඉහල හමුදා නිලධාරීන් පත් කෙරින. ලක්ෂ ගනනක් අවතැන් වූවන් රැඳී සිටින සහන කඳවුරු පාලනය මිලිටරිය සියතට ගත් අතර දිස්ත්‍රික් හා පලාත් මට්ටමේ සිවිල් පරිපාලනයට ඔවුන් සම්බන්ධ කරනු ලැබිනි.

ජනාධිපතිනිය මෙම අත්‍යසාමාන පියවරයන් ගැනීම පිලිබඳව කිසිදු පැහැදිලි කිරීමක් නො කලා ය. හදිසි තත්වය පැනවූයේ ‘‘නීතිය පවත්වාගෙන යාම’’, ‘‘ජන ජීවිතයට අත්‍යවශ්‍ය වන සැපයුම් හෝ සේවාවන් පවත්වා ගෙන යාම’’, ‘‘මහජන ආරක්ෂාව’’ සඳහා බව නිවේදනය තුල ප්‍රකාශ වී තිබේ. කෙසේ වෙතත් කුමාරතුංග වත් ආන්ඩුව වත් මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතීන් පාගා දැමීම සුනාමියෙන් විපතට පත් ජනයාට සහනයක් වන්නේ කෙසේ දැයි විස්තර කර නැත.

සුනාමිය බලපෑ ප්‍රදේශවල සිදු වූ කොල්ලකෑම්, ස්ත්‍රී දූෂන සහ ලමුන් පැහැර ගැනීම් පිලිබඳව තරයේ ම අතිශයෝක්තියට නැංවූ වාර්තා උලුප්පා දක්වමින් කොලඹ පුවත් පත් ජනාධිපතිගේ තීරනය තර්කානුකූල කිරීමට වෙර දැරී ය. එවැනි හුදෙකලා සිදුවීම් පුලුල් හදිසි බලතල පැනවීම තුලින් යුක්ති සහගත කල නො හැක. සාමාන්‍ය ජනයාගේ පුලුල් ප්‍රතිචාරය වූයේ මුදලින් ද, ද්‍රව්‍යවලින් ද, ස්වේච්ඡා කටයුතු වල නිරතවීමෙන් ද ව්‍යසනයට ගොදුරුවූවන්ට උදව් උපකාර කිරීම ය. හදිසි තත්වය සියල්ලටමත් වැඩියෙන් යොදාගත්තේ ආන්ඩුවේ සහන කටයුතුවල ප්‍රසිද්ධියේ පෙනෙන්නට තිබුන අඩුලුහුඩුකම් පිලිබඳව පැතිරුන මහජන විරෝධයෙන් ආන්ඩුව රැකගැනීමට ය.

මෙම විධිවිධානවල පරාසය සහන කටයුතුවලට සීමා නො වී ය. නිවේදනය තුල ‘ජාතික ආරක්ෂක අවශ්‍යතාවන්’ සහ ‘නීතිය පවත්වා ගෙන යාම’ පිලිබඳව බලය පාවිච්චි කිරීමගැන යලියලිත් සඳහන් කෙරෙයි. වෙනත් වචනවලින් පැවසුව හොත්, සුනාමිය ගැන සහ ඉනික්බිති ඇතිව තිබෙන තත්වයට කිසිදු සම්බන්ධයක් නැති කාරනා පිලිබඳව කටයුතු කිරීමට මිලිටරියට, පොලීසියට සහ නිලධාරි තන්ත්‍රයට පුලුල් බලතල ලබා දී තිබේ.

දෙමල ඊලම් විමුක්ති කොටින්ට (එල්ටීටීඊ) එරෙහිව 20 වසරක යුද්ධයේ කොටසක් ලෙස දරුනු හදිසි නීති රෙගුලාසි පැනවීම පිලිබඳව කොලඹ පැවති ආන්ඩුවලට දීර්ඝ ඉතිහාසයක් තිබේ. දෙමල සුලුතරය පීඩාවට ලක් කිරීමට හා බියවැද්දීමට මිලිටරිය හා පොලීසිය එවැනි බලතල යොදාගත් අතර දහස් ගනන් දෙමල ජනයා නඩු නැතිව රඳවා තැබීමට ද ත්‍රස්ත-විරෝධී නීතිවල උදව් ඇතිව, එම බලතල යොදා ගැනින. ස්වභාවික විපත්තියකට ප්‍රතිචාර වසයෙන් හදිසි තත්වය ප්‍රකාශ කල ප්‍රථම වතාව මෙය ය. නව රෙගුලාසි බලපැවැත්වෙනුයේ සුනාමියෙන් ඍජු ලෙස පහර වැදුනු දකුන හා නැගෙනහිර වෙරල තීරුවේ දිස්ත්‍රික්කවලට පමනක් නො වේ. කොලඹ සහ ගම්පහ යන බටහිර දිස්ත්‍රික්කයන්ට ද එය බලපැවැත්වෙයි. බටහිර දිස්ත්‍රික්ක විශාල ලෙස විපතට පත් නො වුන ද ප්‍රදේශයේ ජනගහනය ප්‍රධාන වසයෙන් සංකේන්ද්‍රනය වූ අගනුවර ඊට අයත් වෙයි. මෙම ප්‍රදේශ තුල පොලීසියට, සන්නද්ධ හමුදාවන්ට සහ ජනාධිපති පත්කරනු ලබන අන් ඕනෑම කෙනෙකුට විශාල බලතල හිමි වේ.

රජයේ නිලධාරීන් අතර 'කලකිරීම ඇතිකරවීම; මහජන ආරක්ෂාවට, රටේ නීතියට හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමේ දී ද්වේෂසහගත පෝස්ටර්, අත්පත්‍රිකා හෝ දැන්වීම් බෙදා හැරීම', හෝ 'මහජනයා තුල භීතිය හෝ කැලඹීම් ඇති කරන යම් හෝ කටකථා හෝ සාවද්‍ය ප්‍රකාශ පැතිරවීම' වරදක් බව මෙම රෙගුලාසිවලින් පැවසේ.

මෙම නීති රෙගුලාසි කෙතරම් ව්‍යාකූල ද යත් ආන්ඩුව මොනයම් අයුරකින් හෝ විවේචනය කරන, ඊට විරුද්ධත්වය පාන කවර හෝ පුද්ගලයකුට තුන් මසකට නො අඩු හා 5 වසරක උපරිමයකට යටත් සිර දඬුවම් පැමිනවිය හැකි වරදක් කල බවට දඬුවම් කල හැකි ය.

ප්‍රාදේශීය හමුදා බලධාරීන්ට ඕනෑම ගොඩනැගිල්ලක් හෝ නිවාසයක් පවරාගත හැක. ජනාධිපති පත්කරන 'නිසි බලධරයා'ට ඕනෑම වාහනයක් අත්පත් කර ගත හැක. ''ජාතික ආරක්ෂාව හෝ අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාම සම්බන්ධිතව හෝ ඊට උපකාරී වන ඕනෑම කටයුත්තක් කිරීමට හෝ ඕනෑම පෞද්ගලික සේවාවක් සැපයීමට හෝ ඕනෑම පුද්ගලයකුට නියෝග කිරීමට'' බලධාරීන්ට පුලුවන.

12 වන රෙගුලාසිය යටතේ ජනාධිපතිනියට වර්ජන සහ සියලුම ආකාරයේ වෘත්තීය ක්‍රියා මාර්ග නීති විරෝධී කරමින් 'ඕනෑම සේවාවක් අත්‍යවශ්‍ය සේවාවක්' බවට ප්‍රකාශයට පත් කල හැක. තමන්ගේ රාජකාරිය ඉටු කිරීමට අසමත් වන ඕනෑම අයකු සේවයෙන් පහකිරීමට, ආන්ඩුවේ නිවාසවලින් ඉවත් කිරීමට සහ වරදක් කල බවට චෝදනාවට ලක්කිරීමට පුලුවන. එසේම, අත්‍යවශ්‍ය සේවාවක නියැලී සිටින්නකුට බාධා කිරීමට හෝ ඉන් වැලැක්වීමට උත්සාහ දැරීම වරදකි. එසේම අත්‍යවශ්‍ය සේවයේ යෙදෙන්නන්ට තම කාර්යයන්ගෙන් වැලකී සිටීමට පෙලඹවීම, උසිගැන්වීම හෝ අනුබලදීම වරදකි.

ආරක්ෂක හමුදා විසින් හෝ අත්‍යවශ්‍ය සේවාවන් සඳහා හෝ පවරා ගනු ලැබූ ප්‍රදේශවලට අනවසරයෙන් ඇතුල්වීම වැලැක්වීමට රෙගුලාසි වලින් බලතල ලබා දී තිබේ. එවන් බලතල දකුනු වෙරලේ මීටර් 100ක් ඇතුලත ද උතුර හා නැගෙනහිර වෙරලේ මීටර් 200ක් ඇතුලත ද නිවාස යලි ඉදිකිරීම තහනම් කරන ආන්ඩුවේ තීරනය ක්‍රියාත්මක කිරීමට යොදාගත හැකි ය. තමන්ගේ වැඩ කටයුතුවලට බාධාකාරී වන මෙම සීමාවන් ධීවරයන්ගේ සහ අන් අයගේ ද දැඩි විරෝධයට ලක්ව ඇත.

16 වන රෙගුලාසිය යටතේ පැහැරගෙන යාම, ස්ත්‍රී දූෂනය වැනි අපරාධ නීති සංග්‍රහය යටතේ යම් වැරදි සිදු කලා යැයි සැකයට ලක්වන අය පරීක්ෂා කිරීමට සහ වරෙන්තුවකින් තොරව අත් අඩංගුවට ගෙන රඳවා තැබීමට පොලීසියට සහ මිලිටරියට පුලුල් බලතල ලැබෙයි.

යම් තැනැත්තකු හදිසි නීති රෙගුලාසි ප්‍රකාර වූ බලතල පාවිච්චි කිරීමට බාධා කිරීම වරදකි. එසේම මෙම රෙගුලාසි උල්ලංඝනය කරන යමෙකුට සහාය වීම ද වරදකි. ප්‍රාදේශීය බලධාරීන් වෙන යම් වරදක් පිලිබඳව වාර්තා නො කිරීම වරදකි. රඳවා ගත් අය ප්‍රශ්නවලට පිලිතුරු දීමට බැඳී සිටී. තව ද එවන් අයෙක් පොලිස් හෝ හමුදා නිලධාරියකුගේ බාරයේ සතියක් දක්වා වූ කාලයක් තාවකාලිකව රඳවා තබා ගත හැක.

චූදිතයා සන්තකයේ වූ ඕනෑම පොතක්, ලේඛනයක් හෝ පුවත්පතක් මෙන් ම ඉහත මාර්ගයන්ගෙන් බලහත්කාරයෙන් ගන්නා වූ ඕනෑම පාපොච්චාරනයක් සහ ප්‍රකාශනයක් නඩු විභාගයක දී පිලිගැනේ. හදිසි නීතිය යටතේ වන වැරදි පිලිබඳ නඩු විභාගවලට ප්‍රමුඛතාවක් ලැබේ.

ආන්ඩු නිලධාරීන්ට විරුද්ධ වූයේ යයි හංවඩු ගසන අයෙකු රඳවා තැබීමට හා නඩු පැවරීමට පලල් විධිවිධාන තිබුන ද හදිසි බලතල පාවිච්චි කරන ඕනෑම අයකු නීතිපති මගින් කෙරෙන්නක් හැර අන් සෑම නීතිමය ක්‍රියාමාර්ගවලින් ම ආරක්ෂා කර තිබේ.

හදිසි නීතියේ සුවිශාල බලතල සුනාමියට ගොදුරු වූවනට උදව් උපකාර පිනිස නොව රාජ්‍ය යාන්ත්‍රනය අබාධිතව ක්‍රියාත්මක කරලීම සඳහා ය. රෙගුලාසි එල්ල කර තිබෙන්නේ ආරක්ෂක හමුදාවන් විවේචනය කරන, විරෝධය පාන හා බාධා පමුනුවන අය කෙරෙහි වන අතර ඔවුන් අල්ලා රඳවා ගෙන ප්‍රශ්න කර පවත්නා අවම නීතිමය ආරක්ෂාවකින් පවා තොරව නඩු පැවරීමට ද ප්‍රතිපාදන සලසා තිබේ.

මෙවන් දරුනු විධිවිධානයන් හොර රහසේ පැනවීමට කුමාරතුංග ගත් තීන්දුව ඇගේ පරිපාලනය ද, සමස්තයක් ලෙස දේශපාලන සංස්ථාපිතය ද මුහුන දී සිටින ගැඹුරු අර්බුදය සලකුනු කරයි. පසුගිය අප්‍රේල් මස එජනිස ආන්ඩුව බලයට පැමිනියේ ජීවන තත්වයන් නගා සිටුවීමටත් එල්ටීටීඊය සමග සාම සාකච්ඡා යලි ඇරඹීමටත් පොරොන්දු වී ගෙන වුව ද ඒ දෙකම අසාර්ථකව තිබේ. සුනාමියට පෙර පවා එජනිසය ඔවුන්ගේ කඩ කරන ලද පොරොන්දු හේතුවෙන් වැඩෙන කෝපයකට හා වෛරයකට ලක්ව සිටියහ. නිල ගනන්බැලීම් අනුව දැන් 40,000කට ආසන්න සංඛ්‍යාවක් මියගොස් දසලක්ෂයක් තරම අවතැන්ව සිටී. දිවි ගලවාගත් බොහෝ අයට සිය පවුලේ අය, නිවාස දේපල සහ ජීවනෝපායයන් අහිමි වී ඇත. විපතට පත්වූවන්ගෙන් අතිවිශාල බහුතරයක් දුප්පතුන් වන අතර ඔවුන්ගේ සහායට අන් විකල්ප මාර්ග නැත. ව්‍යසනයෙන් මසක් ඉකුත් වී ඇතත් සමහරුන්ට කිසිදු සහනයක් ලැබී නැත.

ආන්ඩුවේ සහන කටයුතුවල අප්‍රමානවත් හා අසංවිධානාත්මක ස්වභාවය ආරම්භයේ දී තිබූ විශ්මය, අවිනිශ්චිත භාවයන් හා කෝපයන් බවට හැරී තිබේ. වෙරල තීරයට ආසන්නව ඉදිකිරීම් ආන්ඩුවෙන් තහනම් කිරීම සහ සහන සේවා නැතිකම පිලිබඳව විරෝධතා ඇතිවිය. සුනාමිය, පෙර තිබූ සමාජ සහ දේශපාලන ආතතීන් සංකීර්න කර ලූ අතර හුදෙක් ආන්ඩුව පිලිබඳව පමනක් නොව සමස්තයක් ලෙස දේශපාලන පද්ධතිය

පිලිබඳව ම ජනගහනයේ පුලුල් ස්ථරයනට පැවති දුරස්ත භාවය උග්‍ර කර තිබේ.

සමාජ අසහනයේ අන්තරායයන් පිලිබඳව දේශපාලන සංස්ථාපිතය හොඳින් දැනුවත් ය. ඒ නිසාම කිසිදු දේශපාලන පක්ෂයකින් හෝ මාධ්‍යයේ කිසිදු කොටසකින් හෝ කුමාරතුංගගේ ඒකාධිපති තීන්දුවලට කිසිදු විරුද්ධත්වයක් පල නො වේ. කුමාරතුංගගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැරුන කල එජනිසය තුල වන විශාලතම පක්ෂය වන ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) 'පුලුල් බලතල' සහිත ජාතික මධ්‍යස්ථානයක් පදනම් කර ගත් ''ජාතිය යලි ගොඩනැගීමේ'' ඔවුන්ගේ ම සැලැස්මක් ඉදිරිපත් කර තිබේ.

වැහැරී ගිය වාම පක්ෂ වන ලංකා සමසමාජ පක්ෂය හා ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂය ද එජනිසයේ කොටස්කාරයින් ය. ලසසප නායකයෝ හදිසි නීතිය පිලිබඳව මුනිවත රකිති. ව්‍යවස්ථා සම්පාදක ඇමති වන කොප නායක ඩිව් ගුනසේකර ඉරිදා වනතුරු නිහඬව සිට ප්‍රකාශ කලේ තත්වය පාලනය කර ගැනීමෙන් අනතුරුව හදිසි නීතිය ඉබේම අහෝසි වීමට ඉඩ සැලසීම ආන්ඩුවේ අභිමතය බව ය. ප්‍රධාන විරුද්ධ පක්ෂ සන්ධානය වන කොන්සවේටිව් එක්සත් ජාතික පෙරමුන හදිසි නීතිය පිලිබඳව කිසිදු ප්‍රකාශයක් කර නැත. මාධ්‍ය පැත්තෙන් බැලූ විට මෙම රෙගුලාසිවල මර්දනකාරී ස්වභාවය පිලිබඳව විවේචනය කිරීමක් තබා කුමාරතුංගගේ තීන්දුව පිලිබඳ වාර්තා කිරීමක් පවා නැති ගාන ය.

ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට අනුව හදිසි නීතිය පැනවීමෙන් මාසයක් ඇතුලත එය පාර්ලිමේන්තුවෙන් අනුමත කල යුතු ය. අනුමත කිරීම පෙබරවාරි 6 වන දාට යෙදී තිබුන ද පාර්ලිමේන්තුව පෙබරවාරි 8 දක්වා රැස් නො වීම හේතුවෙන් හදිසි නීති රෙගුලාසි අහෝසි වී යෑමට ඉඩ ඇති බවක් පෙනේ. එහෙත් හදිසි නීතිය පැනවූ රහසිගත ආකාරයත් එයට කිසිදු විරෝධතාවයක් නැති වීමත් තමන්ගේ පාලනය රැක ගැනීමට සමස්තයක් ලෙස පාලක පන්තිය උග්‍ර ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම අනුයෑමට පැකිලෙන්නේ නැති බවට කම්කරු පන්තියට කරනු ලබන තියුනු අනතුරු ඇඟවීමකි.

© www.wsws.org